# 4. ෆික්හුල් උස්රා

## 4.1 ඉස්ලාමීය පවුල් ජීවිතය

මිනිසාට කිසිද තනිව ජීවත්විය නොහැක. මවගේ ආදරයත්, පියාගේ මග පෙන්වීමත් සියළු දෙනාටම අනිවාර්ය වේ. සැමියා-බිරිඳ, දූ දරුවන් එක් පවුලෙහි සාමාජිකයන් වන්නෝය. ලෝකයෙහි පැවැත්ම උදෙසා දෙවියන් වහන්සේ සියළු දෑ ජෝඩු වශයෙන් මවා ඇත්තේය. මිනිසාවද ස්ත්‍රී, පුරුෂ යනුවෙන් මවා ඇත. ආදම් (අලෛ), සහ හව්වා (අලෛ) යන ප්‍රථම ජෝඩුවෙන් අල්ලාහ් ලොවට මනුෂ්‍ය ජාතිය බිහි කළේය. ගැහැණු පිරිමින්ටත්, පිරිමින් ගැහැණුන්ටත් උපකාරිවීම ස්වභාවයේ ගති ගුණයකි.

ස්ත්‍රී පුරුෂ බැඳීම, ඉස්ලාම් ගෞරවාන්විතව සඳහන් කරයි. විවාහය යන ගෞරවාන්විත බැඳීම තුළින් ගිහි ජීවිතය ගත කර, යහපත් ගතිගුණ ඇත්තෙකු සේ ජීවත්වීමටත්, එමඟින් අල්ලාහ්ගේ තෘප්තිය ලබා පරමාන්තය ජය ගැනීමටත් පවුල් ජීවිතයේ සැමියා, බිරිඳ, දූ දරුවන් අතර බැඳීම හා ආදරය තිබිය යුතුය. මේ සියළු කොටස්වලට යුතුකම් හා අයිතිවාසිකම් ඉස්ලාමය විසින් තනි තනිවම ලබා දී ඇත. මේ නිසා එකී කොටස් අතර ගැටළු වළක්වා ගැනීමට හැකි වන්නේය.

සැමියා, භාර්යාවට හා දූ දරුවන්ට ආරක්ෂාව, ආහාර, ඉඳුම්-හිටුම් සපයා දිය යුතුයි. ඉස්ලාමයට අනුව ඔවුන් හැඩගැස්වීමද, ඔවුන්ගේ අධ්‍යාපනය, සෞඛ්‍යය යනාදියද සකසා, ඔවුන්ව සෙනෙහසින් රැක බලා පෝෂණය කිරීම සඳහා උපයා වියහියදම් කිරීම ද අනිවාර්‍ය වේ.

ඉස්ලාමයේ අදහස් විවාහය මිනිසාව උසස් තත්ත්වයකට පත් කරනු ලබයි යන්නය.

"දුගී දුප්පත් අයව අල්ලාහ් විවාහය මගින් වත්පොහොසත් අය බවට පත් කරන්නේය" (අල් කුර්ආනය) මෙම පාඨය මගින් විවාහ ජීවිතය දයාව පිරිපුන් එකක් බවට පිළිගත හැකිය.

"අල්ලාහ්ගේ ශුද්ධ වූ මාර්ග වියදම් කරන දිනාරය, වහලුන් නිදහස් කිරීමට වියදම් කරන දිනාරය අඹු දරුවන් සඳහා වියදම් කරන දිනාරය, මේවායින් ඔබ ඔබේ අඹු දරුවන්ට වියදම් කරන දිනාරය ඉතා ආනිසංස ගෙන දෙන්නකි" (මුස්ලිම්)

මේ නිසා සැමියා වෙත වගකීම් රාශියක් පැවරී ඇත. කෙසේ හෝ අනුමත මාර්ගයේ උපාය පවුල හා දූ දරුවන් රැකබලා ගැනීමට ඔහු වෙහෙසෙයි. ඔහුගේ ඉපැයීම මගින් ලෝකයද සශ්‍රීක වන්නේය.

සැමියා හා බිරිඳ අතර වූ මේ බැඳීම හා වගකීම් නිසා තම පවුල් ජීවිතය සාරවත් වේ.

"ඔබ සියළු දෙනාම මෙහෙය වන්නන් වේ. ඔබේ රැකබලා ගැනීම් ගැන පරමාන්තයේ ප්‍රශ්න කරනු ලබයි. සැමියා ඔහුගේ වගකීම් ගැනද, බිරිඳ ඇයගේ වගකීම් ගැනද ප්‍රශ්න කරනු ලබයි" (බුහාරි මුස්ලිම්), යයි නබි (සල්) තුමාණන් පවසා ඇත.

"සැමියාගේ තෘප්තිය ලබා සිටින විටදී මරණයට පත්වෙන බිරිඳ ස්වර්ගයට පිවිසෙන්නේය." (ඉබ්නු මාජා)

"ඔබේ භාර්යාවන්ට උතුම් පුද්ගලයා ඔබ අතරින් උතුම් වන්නේය" (තිරිමිදි)

ඉහත සඳහන් හදිස් මගින් පවුල නඩත්තු කිරීමේ වගකීම සැමියා සතු වගකීමකි, යන්න පැහැදිලි වේ.

දරුවන් හද වඩා ගැනීම, ගෘහ පාලනය වැනි දෑ බිරිඳ සතුය. සැමියා බැහැර ගොස් ඉපැයීමෙහි යෙදී සිටින විට දී බිරිඳ "පවුල" නම් ආයතනය ගොඩනගයි. සැමියා සමඟ එක් වී, දූ දරුවන්ගේ සුවදුක්, ඕනෑ - එපාකම් සොයා බලයි. "පවුල" නමැති ආයතනයෙන් විනය ගරුක දරුවන් සමාජයට බිහි කරයි. "ඔබගේ දරුවන්ට ගෞරවය කරන්න. ඔවුන්ට විනය, ගතිගුණ, සංවරය උගන්වන්න! මක්නිසාද යත්, දූ දරුවන් අල්ලාහ්ගේ දයාදයන් වන්නේය." (ඉබ්නු මාජා)

"යම් කෙනෙකු මියගිය විට ඔහුගේ සියළු කාර්යයන් ඇණ හිටීමට ලක්වේ. එනමුදු සදතනික දානමාන, ප්‍රයෝජනවත් ශිල්පය, දෙමව්පියන් වෙනුවෙන් ප්‍රාර්ථනාවෙහි යෙදෙන දරුවන්, මේ කරුණු තුන නොකඩවා කුසල් ලබා දේ." (මුස්ලිම්)

දරුවෙක් වැදීම පමණක් ප්‍රමාණවත් නොවේ. ඔවුන් යහපත් අයුරින් හැඩගැස්විය යුතුයි. ඉහත කී හදිසයෙන් මෙය සනාථ වේ. දෙමව්පියන් දරුවන් වෙනුවෙන් ඉටුකළ යුතු වගකීම් රාශියක් තිබේ. සුදුසු නාමයක් තැබීම, ශිල්පය ලබාදීම, ගතිගුණ ඉගැන්වීම යනාදී එයින් සමහරක් වේ. මෙ මගින් යහපත් මුස්ලිම්වරයෙකු මෙන්ම ඉස්ලාමීය සමාජයක් ද බිහි වන්නේය.

## නිවස

ඉස්ලාම් මිනිස් ජිවිතයේ ප්‍රථම පුහුණු කඳවුර ලෙස නිවස හඳුන්වයි. සැමියෙකු තම බිරිඳ හා දූ දරුවන්ට යහපත් වාසස්ථානයක් සකසා දිය යුතුයි. එය අල්ලාහ් හා ඔහුගේ රසුල්ව හඳුන්වා දෙනු ලබන ස්ථානයක් ලෙසත් පැවතිය යුතුයි. අවශ්‍යතාවයන්ට වඩා අලංකාරවත් ලෙස නොතිබිය යුතුය. රන් හා රිදී භාවිතා කර නිවසක් තැනීමෙන් වැලකිය යුතුයි. ආක්‍රමණය කළ තැනක, නිවසක් තැනීම හා ජිවත්වීම ඉස්ලාම් තහනම් කර ඇත. නිවස යහපත් ස්ථානයක, යහපත් ලෙස ගොඩ නගා ගත යුතුයි. දරුවාගේ පුහුණු කඳවුර නිවස වේ. එහි කතා කිරීමට, හැකියාවන් එළිදැක්වීමට, ශරීරය හසුරුවන්නට ඉගෙන ගනී. මේ අතර කලිමාව උසුරීමට, අල්ලාහ්ට තුති කිරීමට, සලවාත් කීමට, කුර්ආනය පාරායනය කිරීමට, යහපත් වචන කතා කිරීමට සහ පවුල් සාමාජිකයන් සමඟ හැසිරීමට ආදර්ශය ලබා ගනී. නිවසේ පරිසරය ඔහුගේ සියළු කටයුතුවලට ආදර්ශවත් වන්නේය. ළමයින් දකින දෑ කිරීමට, අසන දේ කතා කිරීමට පුරුදු වී සිටිති. නිවසෙහි වෙසෙනා වැඩිහිටියන් තම ක්‍රියාකාරකම්, ළමයින්ගේ අවදනයට ලක්වන නිසා, යහපත්ව හැඩගසා ගත යුතුයි. එවිට නිවසෙහි සිටින දරුවාද යහපත්ව වැඩේ.

"සලාම්" කියා නිවසට ඇතුළුවීම, සියළු කටයුතු "බිස්මි" කියා ආරම්භ කිරීම, සතුටකදී අල්ලාහ්ට තුති කිරීම, පවුලේ සාමාජිකයන්ට උදව් කිරීම, දෙමව්පියන්ට ගරු කිරීම, අදනයට සවන්දීම, අවස්ථානුකූල දුආවන් කීම, කුර්ආනය නිසියාකාරව පාරායනය කිරීම හා කටපාඩම් කිරීම, ශබ්ද නගා කථා නොකිරීම, අන් අයට සවන් දීම, ස්තුති කිරීම, ගෞරවය දැක්වීම, සෙනෙහස පෑම, වේලාවට කටයුතුවල යෙදීම, බඩුබාහිරාදිය නියමිත ස්ථානයෙහි තැබීම, යහපත් දෑ වලට දකුණු අත උපයෝගී කිරීම යනාදී යහපත් ගතිගුණ නිවසින් හුරුපුරුදු කළ යුතුයි. නිවසෙහි ඇතුළත හා පිටත පරිසරය පිරිසිදුව හා මනස්කාන්ත ලෙස තබා ගත යුතුය.

"ඔබගේ නිවස අල්ලාහ් ඔබට ශාන්තිය ගෙන දෙන ස්ථානයක් ලෙසට මවා ඇත්තේය." (6-80) නිවසෙහි ගැහැණු පිරිමි දෙපක්ෂය සඳහා වෙන් කරන ලද තැන් හා දෙරටුන් පිහිටා තිබීම වැදගත් වේ.

"ඔබගේ නිවස් සොහොන් බවට පත් නොකරන්න" (මුස්ලිම්) නිවසෙහි සලාතය, තස්බීහ් යනාදිය ඉටුවිය යුතුයි. සලාතය සඳහා වෙනම ස්ථානයක් වෙන් කර තැබිය යුතුයි. ඉස්ලාම් අප්‍රිය කරන රූප සටහන්, සිනමා දර්ශනයන්ට ඉඩ නොතැබිය යුතුයි. එවිට අල්ලාහ්ගේ දයාව ලැබෙන නිවසක් වන්නේය.

යහපත් සමාජයක් හා ඉස්ලාමීය සංස්කෘතිය රැකීමට මව්වරුන් තම නිවසෙහි රැඳී සිට යුතුකම් ඉටුකළ යුතු යයි ඉස්ලාම් දේශනා කරයි.

අභ්‍යාසය

කෙටි පිළිතුරු සපයන්න.

1. ලෝකයේ පැවැත්ම සඳහා අල්ලාහ් මැවීම් කර තිබෙන්නේ කෙසේද?

2. ඉස්ලාම් ස්ත්‍රී, පුරුෂ සම්බන්ධතාව ගරු කරන්නේ කෙසේද?

3. බිරිඳ හා ස්වාමි පුරුෂයාගේ යුතුකම් වෙන් වෙන්ව සටහන් කරන්න.

4. "පවුල් ජීවිතය අල්ලාහ්ගේ කරුණාවට පාත්‍ර වූවෙකි" මෙය කෙසේ පැහැදිය හැකිද?

5. ලෞකික ජීවිතය කෙසේ සශ්‍රීක වන්නේද?

6. සැමියා - බිරිඳ, ඔවුන්ගේ වගකීම් සඳහන් කරන හදිස් ලියන්න.

7. දෙමව්පියන්ගෙන් ලබාගත හැකි දෑ මොනවාද?

8. පවුල් අතර වූ ආරවුල් නිරාකරණය කර ගන්නේ කෙසේද?

9. "ඉස්ලාම් නිවස" පහදන්න.

10. දෙමව්පියන්ගේ යුතුකම් මොනවාද?

## පවුල් පරිපාලනය

ස්වාමිපුරුෂයා හා භාර්යාව අතර විවාහ ජීවිතය විධිමත්ව පවත්වාගෙන යැමට නම් දෙපාර්ශවයම තම තමන්ගේ කාර්යයන් පිළිබඳ දැනගෙන ක්‍රියා කළ යුතුයි.

අල්ලාහුතආලා අල්-කුර්ආනයේ "ස්වාමි පුරුෂයා, භාර්යාවට පොරවනයක් සේම, භාර්යාව ස්වාමිපුරුෂයාටද පොරවනයක් සේ මවා ඇත." (2-187) යැයි ප්‍රකාශ කරයි.

"ස්ත්‍රීන්ට, පුරුෂයින් කළයුතු කාර්යයන් මෙන්ම, පුරුෂයින්ට ස්ත්‍රීන් කළ යුතු යුතුකම් ද තිබේ" (2,228) මෙලෙස කුර්ආනය කාන්තාවන්ගේ අයිතිවාසිකම් භුවා දක්වා ඇත. එනමුදු පවුල පරිපාලනය කිරීමේ කටයුතු පුරුෂයා මගින් කළ යුතු හෙයින්, ඔවුන්ට අයිතිවාසිකම් හා බලතල මදක් වැඩිපුරය ලබා දී ඇත.

ගෘහ පාලනය පුරුෂ පක්ෂය විසින් කළ යුතු යයි ඉස්ලාම් අවවාද කරයි. මෙයට හේතුව ස්ත්‍රියට නායකත්වයේ කාර්යභාරය නිසි ලෙස ඉටුකළ නොහැකි හෙයිනි. ස්ත්‍රියගේ නායකත්වයෙන් යුතු පවුල් නොයෙකුත් අක්‍රමිකතාවයන්ට ගොදුරු වේ.

"ස්ත්‍රියගේ නායකත්වයෙන් යුතු සමාජයක් කිසිදාක ජය නොලබයි" යනුවෙන් රසූල් (සල්) තුමාණන් පවසා ඇත. ශරීර ශක්තිය, දක්ෂතාවය, හැකියාව පිරිමියා සතු හෙයින් ගෘහ පාලනය ඔහු විසින් කළ යුතුයි.

විවාහ ගිවිසුමේදී මනමාලයා විසින් මනමාලියට "මහර්" ප්‍රදානය කළ යුතුයි. "මහර්" ප්‍රදානය කිරීම ඉස්ලාම් අනිවාර්යය කර ඇත. මෙය පවුල සුරැකිව රැකබලා ගැනීම හා පුරුෂයාගේ ආර්ථික ශක්තිය විදහා දක්වන්නකි.

ස්වාමි පුරුෂයා, බිරිඳ සමඟ ගැටළු මතු නොවන තත්වයක ජීවත් විය යුතුය.

"ඔබ, ඔබේ බිරිඳ ළඟ යම් අඩුපාඩුවක් දැකීමෙන් පමණක් අප්‍රිය නොකරන්න. ඇය ළඟ තවත් බොහෝ උසස් ගුණාංග දැකිය හැකිය" (මුස්ලිම්)

පවුලෙහි ප්‍රධානියා හා ස්ත්‍රීන්ගේ ප්‍රධානියා ද පුරුෂයා වන්නේය. ස්වාමි පුරුෂයා තම පවුල වෙනුවෙන් නඩත්තුව දැරිය යුතුයි. තම පවුල සඳහා අවශ්‍ය කෑම් බීම්, ඉඳුම් හිටුම් වැනි අත්‍යාවශ්‍ය දෑ පිරිමියා විසින් සැපයිය යුතු සේම, බිරිඳ ස්වාමි පුරුෂයාට ඉටුකළ යුතු වගකීම් ද රසූල් (සල්) තුමාණන් මතක් කර දී ඇත.

ස්ත්‍රීන් තම පුරුෂයාට, දූ දරුවන්ට කරුණාවන්තව හා ඔහුගේ වස්තූන් රැකබලා ගන්නා සේම, පුරුෂයා නොමැතිවිටදී තම පතිවත සුරැකීමෙන් ද සිටිය යුතුයි.

"ලෝකයේ සියලු දෑ සතුට ගෙන දෙන්නෙකි. මෙයින් ඉතා උසස්ම සතුට වන්නේ හොඳ බිරිඳකි" රසූල් (සල්) තුමාණන් පැවසූහ.

"උසස් ගතිගුණ වලින් පිරි බිරිඳ, මිනිසෙකුගේ ශ්‍රේෂ්ඨතම වස්තුවයි" නබි (සල්) තුමාණන් පැවසූහ.

ස්වාමිපුරුෂයාගේ ගෞරවය රැකීම ගැන නබි (සල්) තුමාණන් මෙසේ පවසා ඇත. "දෙවියන්ට හැර තව කෙනෙකු වැඳීමට සුදුසු බව මා ප්‍රකාශ කරන්නේ නම් එය ඔබේ ස්වාමිපුරුෂයා වන්නේය" යැයි කීහ. පවුල් පරිපාලනය විධිමත්ව ගෙන යැම සඳහා ස්ත්‍රී පුරුෂ දෙපාර්ශ්වයන්ගේ කැපවීම අවශ්‍ය වේ.

### දෙමව්පියන් හා දූදරුවන්

ලෝකයේ අල්ලාහ් විසින් මිනිසාට දෙනු ලැබූ දායාදය දූ දරුවන් වන්නෝය. ඔහු එම දායාදය නිසියාකාරව හැසිර විය යුතුයි. දෙමව්පියන් තම දරුවන් ඉස්ලාමයට අනුකූලව හැඩගැස්විය යුතුයි. ඔවුන්ට අවශ්‍ය කෑම් බීම්, ඉඳුම් හිටුම් සපයා දීමෙන් පමණක් නොව, ඔවුන්ගේ ගතිගුණ වර්ධනයෙහිලාද සැළකිලිමත් විය.

යුතුයි. ඉස්ලාම් ධර්මයේ අනුශාසනා, අවවාද ඔවුන්ට ඉගැන්විය යුතුයි. එමඟින් ඔවුන් දෙලොව ජයග්‍රහණය අත්පත් කර ගන්නෝය. මේ නිසා කුර්ආනය.

"විශ්වාසවන්තයිනි, ඔබ හා ඔබ නිවැසියන් නිරයේ ගිනි සිලුවෙන් ආරක්‍ෂා කර ගන්න" යයි පවසයි. නබි තුමන් මෙය, "පියෙකු තම දූ දරුවන්ට යහපත් ගතිගුණ ඉගැන්වීම රන් තොගයක් සඳකා කිරීමට වඩා උතුම්ය." යයි පවසා ඇත. (තිර්මිදි)

දෙමව්පියන්, තම දූ දරුවන් නිසිලෙස ජීවත්විය යුතු යැයි සිතා වස්තුව රැස්කර, උරුම කරදීමට බලාපොරොත්තු වෙති. එනමුත්, ඉස්ලාමීය දෘෂ්ඨිකෝණයේ පියකු තම දූ දරුවන් වෙනුවෙන් උරුම කළ හැකි ඉතාම උසස් වස්තුව යහපත් වූ ගති ගුණයන්ය.

"පියෙකු විනයට වැඩි යම් දෙයක් තම දූ දරුවන් වෙනුවෙන් උරුම කළ නොහැකිය."

"යම් කෙනෙකු ළඟ විනය නැති විට ඔහු අනාථයෙක් වන්නේය." (අල් හදීස්)

"දෙමව්පියන්, ඔවුන්ගේ දූ දරුවන් හදා වඩා ගැනීම සම්බන්ධව පරමාන්තයේදී ප්‍රශ්න කිරීමට ලක් වන්නේය" යයි උමර් (රලි) තුමා පවසා ඇත.

"තම දූ දරුවන්ට විනය ඉගැන්වීම සඳහා තම නිවසේ බිත්තියේ වේවැල තබන්නාට අල්ලාහ් දයාද කරත්වා" යයි රසූල් (සල්) තුමා වරෙක පවසා ඇත. එහෙත් ගැහැණු දරුවන් ගැන විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුයි.

"ගැහැණු දරුවන් තිදෙනෙකු විනය ගරුක පුරවැසියන් බවට හදවඩා ගන්නා පියෙකු ස්වර්ගයට පිවිසෙන්නේය" (අල් හදීස්)

"අසව් ! ඔබලාගේ සියළු දෙනාම වගකිව යුත්තන් හා රැකබලා ගන්නන් වේ, ඔබලාගේ යටත් වැසියන් ගැන ඔබගෙන් ප්‍රශ්න කරනු ලබයි" (බුහාරි-මුස්ලිම්)

පරමාන්තයේදී මිනිසා

ඔබේ යුතුකම් ඉටු කළෙහිද?
ඔබේ වගකීම් නිසියාකාරව ඉටු කෙරුවෙහිද?
විශ්වාස කඩ කෙරුවෙහිද?
දූ දරුවන්ට විනය ඉගැන්වූයේ ද?
භාරකාර දෑ නිසි ලෙස ආරක්‍ෂා කෙරුවෙහි ද? යන ප්‍රශ්න කිරීම්වලට ලක්වන්නේය.

මුඃමින්වරුන්ගේ නායකයා ලෙස සැලකෙන අමිරුල් මුඃමිනීන් ද මෙලෙස ප්‍රශ්න කිරීමට ලක්වේ. එසේම තම හාම්පුතාගේ වස්තූන් කෙලෙස ආරක්‍ෂා කෙරුවෙහිද, වහලාගෙන් ප්‍රශ්න කරනු ලබයි. සෑම මිනිසකුමගෙන්ම තම දූ දරුවන්, පවුලේ නඩත්තු ගැනද ස්ත්‍රීන්ගෙන් තම පුරුෂයාගේ වස්තූන් ගැනද ප්‍රශ්න කරනු ලැබේ.

අල්ලාහ්ගේ දයාදයන් ගැනද අපි ප්‍රශ්න කිරීමට ලක්වෙමු. මිනිසා තම දූ දරුවන් දෙලොවෙහි ජය පතා, යහපත් ගතිගුණ වලින් පිරි අය ලෙස හද වඩා ගැනීම අනිවාර්ය වේ.

<u>කෙටි පිළිතුරු සපයන්න</u>

1. ගෘහ පාලනයෙහි ඉස්ලාමය ලබා දී ඇති දේශනාවන් සඳහන් කරන්න.
2. ස්වාමියා හා බිරිඳ අතර බැඳීම ගැන සඳහන් කරන කුර්ආන් වාක්‍යයක් ලියන්න.
3. ස්වාමිපුරුෂයා බිරිඳටත්, බිරිඳ ස්වාමිපුරුෂයාටත් සැලකිය යුතු යුතුකම් වෙන් වෙන්ව ගොනු කරන්න.
4. දෙමව්පියන් දූ දරුවන් වෙනුවෙන් ඉටුකළ යුතු යුතුකම් ලියන්න.

# 4.2 කාන්තා අයිතිවාසිකම්

ජාහිලියත් යුගයේ කාන්තාවන් තම ගෞරවය හා අයිතිවාසිකම් උල්ලංඝනය වූ අයුරින් ජීවත් වූහ. ඉස්ලාම් ඔවුන්ගේ අයිතිවාසිකම් හා ගරුත්වය ලබාදී තත්ත්වය උසස් කොට ජීවත්වීමට මග පාදා දුන්නේ ය.

ලෝකයාට නිසි මග පෙන්වීමට පැමිණි, නබිවරුන් හා උත්තමයන් මෙලොවට බිහිකළේ ද කාන්තාවන්ය. නබි තුමන්ගේ නබිත්වය ප්‍රථමයෙන් පිළිගත්තේද කාන්තාවක්ය. ඉස්ලාමය වෙනුවෙන් දිවි පුදකල අය අතර කාන්තාවෝද සිටිති. සුමෛයා (රලි) තුමිය වැනි වීර කාන්තාවන්ද ඉස්ලාම් ඉතිහාසයේ දක්නට ලැබේ. සටන් පෙරමුණෙහි මුස්ලිම් වීරයින්ට ධෛර්යය ලබා දුන්නා සේම ඔවුන් තුවාලවලට ලක්වූ විට ප්‍රතිකාර කළේ ද මුස්ලිම් කාන්තාවන්ය. කාන්තාවන් ගරු කළ යුතු කොටසකි, යයි මෙයින් අපට වැටහේ.

ඉස්ලාම් කාන්තාවන්ගේ නිදහස හා අයිතිවාසිකම් කිසිදක හෑල්ලුවට ලක් කළේ නැත. සමහර අවස්ථාවන්වල පිරිමින් හා සසඳ කාන්තාවන්ගේ තත්ත්වය උසස් කොටද ඇත්තේය. කාන්තාවන්ගේ කායික හා මානසික දුර්වලතාවයන් සැලකිල්ලට ගෙන ඔවුන්ගේ අයිතින් හා යුතුකම් ඉස්ලාමය විසින් සමහර අවස්ථාවල සීමාවකට ලක් කර ඇත.

ඉස්ලාම්, ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයම සමාන මිනිස් ජන්මය ලෙස සලකයි. පුරුෂයින්ට මෙන් ස්ත්‍රීන්ටද ප්‍රාණයක් ඇත.

"තොප සියලු දෙනාම මවා ඇත්තේ එකම ප්‍රාණයෙනි." (4 : 1)

පිරිමින්ට සේම කාන්තාවන්ටත් ජීවත්වීමේ අයිතිය, නම්බුව සුරැකීමේ අයිතිය ඉස්ලාම් ලබාදී ඇත. කාන්තාවන් ගෞරවයට පාත්‍ර වී නම්බුවෙන් ජීවත් විය යුතු කොටසකි. කාන්තාවන්ට නින්ද කිරීමට කාහටවත් අයිතියක් නැත. ඔවුන්ට නින්ද කරන්නන් එය ඔප්පු කිරීම සඳහා සාක්ෂි හතරක් (4) ක් ගෙන ආ යුතුය. නැතිනම් ඔවුන්ට බරපතල ලෙස දඬුවම් විඳීමට සිදු වේ.

"යම් කෙනෙකු පතිවත සුරැකි කාන්තාවකට නින්ද කලේ නම්, එකී තැනැත්තා සාක්ෂි හතරක් ඉදිරිපත් නොකරන්නේ නම්, නුඹලා ඔහුට කස පහර අසූවකින් දඬුවම් කරන්න. ඔහුගේ සාක්ෂියද කිසිද පිළිනොගන්න." (අල්-කුර්ආනය) (24 : 4)

"මවගේ පාදයෙහි ස්වර්ගය ඇත".

"ඔබෙත් කව්රු හෝ ඔබගේ භාර්යාව සමඟ අවංකව හැසිරෙන්නෙහිද, ඔහු ශ්‍රේෂ්ඨවන්තයාය" මෙම හදීස් වලින් කාන්තාවන් උසස් කොට හුවා දක්වා ඇත.

නබි තුමන් ස්වකීය හජ් දේශනයෙහි දී කාන්තාවන් ගැන විශේෂයෙන් සඳහන් කළහ. ඔවුන් සමඟ මෘදුව හැසිරිය යුතු බවත්, ඔවුන්ට ලිහිල්ව අවවාද කළයුතු බවත්, ඔවුන් අල්ලාහ්ගේ දයාදයත් බවත්, පිරිමින් සේම ඔවුන්ටත් අයිතිවාසිකම් ඇති බවත් තරයේ ප්‍රකාශ කර සිටියහ.

"ඔබලාගෙන් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන් කවුරු කුසලෙහි යෙදුණද අපි එය අපතේ නොහරින්නෙමු. එකෙකු අනෙකාගේ පැවතෙන්නේය. තවද යහපත් ප්‍රතිඵල ගැහැණු, පිරිමි භේදයෙන් තොරව ලබා දෙන්නෙමු." (අල්-කුර්ආනය)

"පිරිමින් උපයා ගත් දෑ ඔවුන්ටද එලෙසම ගැහැණුන් උපයාගත් දෑ ඔවුන්ටද අයිති වන්නේය." (4:32) මෙම කුර්ආන් ආයතය මගින් පිරිමින්ට මෙන්ම ගැහැණුන්ටද එකසේ අයිතිවාසිකම් ඇති බව තහවුරු වේ.

දෙමව්පියන්ගේ හා තම ස්වාමිපුරුෂයාගේ වස්තුවලට උරුමක්කාරයින් වීමේ අයිතිය, පුරුෂයන්ට මෙන් ස්ත්‍රීන්ට ද ලබා දී ඇත. කාන්තාවන්ට රැකියාවක් කිරීමේ අයිතිය, අධ්‍යාපනය ලබා ගැනීමේ අයිතිය, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය, නිදහසේ ජීවත්වීමේ අයිතිය, විවාහවීමේ අයිතිය යනාදී අයිතීන් ගැන විශේෂයෙන් හුවා දක්වා ඇත. අධ්‍යාපනය ලබාගැනීමේදී ගැහැණු - පිරිමි භේදයක් නැත.

"දැනුම සොයා ගැනීම සියලු මුස්ලිම් ජනතාවගේ වගකීමක් වෙයි".

"ස්ත්‍රී හා පුරුෂ යන්න මිනිස් වර්ගයෙහි පැති දෙකක් වන්නේය යයි" රසූල් (සල්) තුමාණන් පවසා ඇත.

"පොරවනය කෙනෙකුට ආරක්ෂාව හා ආකර්ෂණය ගෙන දෙන්නා සේම ගැහැණුන්ට පිරිමින්ද පිරිමින්ට ගැහැණුන්ද ආකර්ෂණය හා ආරක්ෂාව සලසන්නේය". (2:187)

විශේෂයෙන් ම කාන්තාවකට වෛවාහික අයිතිවාසිකම් ලබා දී ඔවුන්ව සුරක්ෂිත කර ඇත. කාන්තාවකගේ අනුමැතිය නොලබා ඇය විවාහ කරදීම, ඉස්ලාම් තරයේ හෙළා දකී. එවැනි විවාහ යෝජනාවක් ඉවත දමන්නටද ඇයට අයිතියක් ඇත. තවද දේව භක්තියෙහි පිරිමින් සේ කාන්තාවන්ටද උසස් තත්ත්වයක් ලබාගත හැක.

සමහර අවස්ථාවල කාන්තාවන්ගේ කායික හා මානසික තත්ත්වය සලකා පිරිමින්ට වගකිවයුතු කටයුතු පවරා තිබුණද පොදුවේ ගත් කළ දෙපක්ෂයම අයිතිවාසිකම් අතින් සමාන වන්නේය.

<u>අභ්‍යාසය</u>

1. ඉස්ලාම් කාන්තාවන් උසස් කොට සලකන්නේ කෙලෙස ද?

2. කාන්තාවන් ගෞරවය කළ යුතු කොටසක් යැයි ඉස්ලාම් ප්‍රකාශ කරන්නේ කිනම් හේතුවෙන් ද?

3. කාන්තාවන්ගේ අයිතීන් ලැයිස්තු ගත කරන්න.

4. නින්ද කිරීම ගැන සටහන් කරන කුර්ආන් වාක්‍ය ලියන්න.
   නින්ද කිරීමට හිමි දඬුවම කුමක් ද?

5. කාන්තාවන් උසස් කොට කතා කරන හදීස් ලියන්න.

6. "පිරිමි හා ගැහැණුන් සමාන වූ තත්ත්වයක සැලකුවත් සමහර අවස්ථාවල ලබාදී තිබෙන අයිතිවාසිකම් අතර භේදයක් ඇත." පහදන්න.

# 4.3 ආහාර හා ඇඳුම් පැළඳුම්

මිනිසාට ජීවත්වීම සඳහා ආහාර අනිවාර්ය වේ. මිනිසා මෙම ආහාරය සමහර ක්‍රම සහ නීති රීතිවලට යටත්ව සොයා ගත යුතුයි. ඔහුට ආහාරයේ හලාල් (අනුමත), හරාම් (තහනම්) වන දේවල් පණවා තිබේ. මිනිසා ස්වකීය ප්‍රාණයට, කයට, බුද්ධියට, ආත්මයට, වින කරන දෙයක් කෑමට හෝ බිමට නොගත යුතුයි.

සැමවිටම මුස්ලිම් කෙනෙකු හරාම් කළ දෑ අනුභව කිරීමෙන් වැළකී සිටිය යුතුයි.

"හරාම් වන දෙය අනුභව කොට වැඩුනු කිසිදු සිරුරක් ස්වර්ගයට නොපිවිසෙයි. එම සිරුර ගැලපෙන්නේ අපායටයි." (තිර්මිද්) යැයි රසූල් (සල්) පවසා ඇත.

හලාල් වූ දේ අනුභව කිරීම ඉබාදතයකි.

"ජනයිනි මහ පොළොවෙහි ඇති දෑයින් අනුමත කළ පිරිසිදු දෑ පමණක් අනුභව කරන්න ! ෂෛතාන්ගේ පියවර නොපිළිපදින්න." (2 : 168)

"විශ්වාසවන්තයිනි, අප ඔබට ලබාදුන් දෑ වලින් පිරිසිදු දෑ පමණක් අනුභව කරන්න." (2 : 172)

අල්කුර්ආනය මේ විශාල පොළෝ තලයේ තිබෙන හලාල් වූ දෑ පමණක් තෝරා බේරා ගත යුතුයයි පවසා සිටි.

1. පොළොව
2. ජලය
3. සත්වයන්

යන තුන් කොටසින්ම එදිනෙදට අවශ්‍ය ආහාර අපි ලබා ගන්නෙමු.

1. මහ පොළොවෙන් ලවණ, ඛණිජ වැලි, ඛණිජ සම්පත්, රන්, රිදී හා ලෝහ වර්ග ලබාගනු ඇත. මෙවන් දේ වලින් මිනිසාගේ ප්‍රාණයට, කයට, හා බුද්ධියට හානි කර නොවන දෑ හලාල්වනු ඇත.

2. ශාකයෙහි කොටස් අතරින් සෞඛ්‍යයට, ප්‍රාණයට හෝ බුද්ධියට හානිකර නොමැති කොටස් හලාල් වනු ඇත. මත් ද්‍රව්‍ය භාවිතය, නිෂ්පාදනය කිරීම හෝ තම දේපල ඒ සඳහා ලබාදීම ඉස්ලාමය හරාම් කර ඇත.

3. සත්වයින්ගෙන් ලැබෙන ආහාර අතරින් සාගරයෙහි වෙසෙන සියලු ජීවීන්, මිනිසුන්ට හලාල්ය. තවද උරගයින්, ගෙම්බන්, කිඹුලන් වැනි සත්වයින්ද හරාමිය. මාළු හා කොළ පෙත්තා (අරාබිකරයේ වෙසෙන) ඉස්ලාමීය ක්‍රමයට අනුව ඝාතනය නොකොට අනුභව කළ හැකිය.මිහිපිට ජීවත්වෙන ගව, එළු, ඔටුවන්, මුවන්, අශ්වයන්, ගෝනුන්, හාවන්, කුකුළන්, පරවියන්, තාරාවන් හා තලගොයන් ඉස්ලාම් අනුමත කළ ක්‍රමය අනුව ඝාතනය කර අනුභව කළ හැකිය. එසේ නොකර අනුභව කිරීම හරාම් ය.

## "අනුභව කිරීමට අනමත නොවූ හරාම් ද්‍රව්‍ය පහත සඳහන් සේ ලැයිස්තු ගත කළ හැකිය."

1. නජිස් ද්‍රව්‍ය - බල්ලා සහ ඌරා යනාදිය.
2. පිළිකුල් සහගත දෑ - පණුවන් සහ සෙම යනාදිය.
3. රුධිරය.
4. තම නියවලින් ඩැහැගෙන ආහාර බුදින පක්ෂීන්-උකුස්සා, රාජාලියා, ගිරවා,
5. රදණක දත් වලින් දඩයම් කරන සතුන්-සිංහයා, බළලා, කොටියා.
6. නොමරන ලෙස වළක්වනු ලැබූවන්-ගෙම්බා, මීමැස්සා.
7. මරා දමන්නට නියමවූවන්-හූනා, සර්පයා, ගෝනුස්සා.
8. පිටඋඩ නැග සවාරියට යොදවන සතුන් (ඔටුවා හා අශ්වයා හැර)
9. මිනිස් මාංශ
10. 'දබිහ්' නොකොට මිය ගිය සතුන් (මසුන් සහ පළගැටියන් (අරාබිකරයේ වෙසෙන) හැර.)

මෙවැනි ආහාර වලින් වැළකී සිටිය යුතුයි. අපගේ දුආවන් හා ක්‍රියාවන් අනුමත කිරීමට නම්, හලාල් වූ දෑ පමණක් අනුභව කළ යුතුයි. ආහාර අනුභවයේදී, ඉස්ලාම් කියා දුන් විධි ක්‍රම අනුගමනය කිරීමෙන් ආනිසංස ලබාගත හැකිය.

තියුණු අවියකින් හෝ දඩයම් බල්ලන් මගින් දඩයම් කිරීමේදී, දඩයම් කරනු ලැබූ සතාගේ ප්‍රාණය ඉවත්වීමට පෙර "දබිහ්" කිරීම අනිවාර්ය වේ.

අල්ලාහ්ගේ නමින් විදින ලද ඊය හෝ අවියේ මුවහත් කොණ වැදීමෙන් සතෙකු දබිහ් කිරීමට පෙර මිය ගියා නම් එය අනුභව කිරීමෙහි වරදක් නැත. නමුත්, අවියේ මුවහත් කොණ හැර, එහි අනෙක් පැත්තෙන් පහර ලැබ දබිහ් කිරීමට පෙර, ඌ මිය ගියා නම්, එය හරාම් වේ.

## ඇඳුම් පැළඳුම්

මුස්ලිම්වරයෙකුගේ 'අව්රතය' වැසීමට ප්‍රමාණවත් තරම් ඇඳුම සකසා ගත යුතුයි. මෙලෙස මුස්ලිම් ස්ත්‍රියකගේ සහ පිරිමියෙකුගේ අව්රතය (අනිවාර්ය ආවරණ කොටස්) ගැන සීමාවන් පණවා ඇත. පුරුෂයින්ගේ අව්රතය පෙකණිය හා දණ හිස අතර වේ. මුහුණ හා මැණික් කටුවෙන් පහළ වූ කොටස් හැර අන් සියළු පෙදෙස් ස්ත්‍රියගේ අව්රතය වේ.

'අල්ලාහ් අලංකාරමත් වේ. ඔහු අලංකාරය අගයයි' (මුස්ලිම්)

'අල්ලාහ් ලැජ්ජාශීලිය. ඔහු ලැජ්ජාශීලි අය ප්‍රිය කරයි.' (අබුදාඋහද්)

මෙවැනි හදිස් අනුගමනය කොට අපේ ඇඳුම් පැළඳුම් නිසියාකාරව සකසා ගනිමු.

"නබිතුමනි, විශ්වාසවන්ත ස්ත්‍රීන්ට පවසා සිටිනු, තමන්ගේ බැල්ම පහත හෙලා සිටින්න. පතිවතද රැකගන්න. තවද, තම දේහයේ පෙන්විය යුතු කොටස් හැර, අනෙක් කොටස්, තමන්ගේ ලස්සණ, අලංකාරය හා ඇඳුම්, ආභරණ නොපෙනෙන සේ සඟවා තබා ගන්න." (අල් කුර්ආනය)

පුරුෂයින් තමන්ගේ විලුඹ පෙනෙන සේ ඇඳුම් ඇඳිය යුතුය. ස්ත්‍රීන්ට එසේ කළ නොහැක. ඇඳුම අව්තරය වැසීමට තරම් ප්‍රමාණවත් විය යුතුය. සේද ඇඳුම් පිරිමින්ට තහනම්ය. ස්ත්‍රීන්ට තහනම් නැත. ඝණ ඇඳුම් ඇඳීම දෙපක්ෂයටම ම වැදගත් වේ.

ගමන් විලාසය, ඇඳුම් හා කතා විලාසය මේවායින් ස්ත්‍රීන් පුරුෂයින්ටද, පුරුෂයින් ස්ත්‍රීන්ටද සමානවීම ඉස්ලාම් තහනම් කර ඇත.

පා පළඳනාවන් ඉස්ලාම් දෙපාර්ශවයටම, අනිවාර්ය කර ඇත. එනමුදු නජිස්වූන ද්‍රව්‍ය වලින් නිමවුණු පාවහන් බැහැර කළ යුතුය. කාන්තාවන්ට ආභරණ පැළැඳිය හැකිය. එය කවර ලෝහයකින් වුවද ගැටළුවක් මතුවන්නේ නැත. පිරිමින්ට රිදී වලින් නිමවුණු මුදුවක් හැර, රනින් නිමවුණු සියළු දෑ හරාම් ය.

"හිස් වැසුමක් සහ පාවහන් පැළඳීම සුන්නතය"

රන් රිදී වලින් නිමවූ භාජනයන්, කන් කසනයන් භාවිතය තහනම් ය.

තවද, ජලය ඇතුළු නොවන නැත්නම් නජිස් ද්‍රව්‍යයකින් නිමවුණු කිසිම ආලේපයකින් අලංකාරය කිරීම හා කෘතිම කොණ්ඩා භාවිතය දෙපක්ෂයටම තහනම් කර ඇත. ස්ත්‍රීන්ට මරුතොණ්ඩි, ශාක සායම් තවරා ගැනීමට අවසර ඇත. පිරිමිනට රැවුලෙහි හා හිස කෙස් වල තවරා ගත හැකිය. කෙසේ වුවද කාන්තාවන් තම ආභරණ සහ ආලේප යනාදී අලංකාර, සෙස්සන්ට ප්‍රදර්ශනය කිරීම තහනම් ය.

"එක් එක් පුරුෂ හා ස්ත්‍රීන්, දේව බැතිය යන ඇඳුමෙන් සැරසී අව්රතය වසා ගත යුතුය."

-(අල් කුර්ආනය)

"ආදම්ගේ දරුවනි ! ඔබගේ ලැජ්ජා ස්ථාන වසා ගැනීමට වස්ත්‍රද, අලංකාර වස්ත්‍රද ඔබලා වෙත අපි පහළ කළෙමු. බියබැතිය නැමති වස්ත්‍රය, එය ඉතා අගනේය. ඔවුන් මෙනෙහි කරන පිණිස මේ සියල්ල අල්ලාහ්ගේ සාක්ෂින්ය" (7 : 26)

ඇඳුමක් අඳින විටදී, දකුණ ප්‍රථමකර, පහත සඳහන් දුආව පරායනය කළ යුතුයි.

اللَّهُمَّ لَكَ الْحَمْدُ أَنْتَ كَسَوْتَنِيهِ، أَسْأَلُكَ مِنْ خَيْرِهِ وَخَيْرِ مَا صُنِعَ لَهُ، وَأَعُوذُ بِكَ مِنْ شَرِّهِ وَشَرِّ مَا صُنِعَ لَهُ»

"අල්ලාහ්තආලාගේ නාමයෙන් මෙය ඇඳ ගන්නෙමි. සියළු ප්‍රශංසාවට අධිපති නුඹ වන්නේය. නුඹම මට මෙය ලබා දුන්නේය. මෙහි ආනිසංස මට ලබා දෙත්වා ! තවද, මෙය කුමක් සඳහා නිමවනු ලැබුවේද? එහි ආනිසංසද මට ලබා දෙත්වා ! තවද, මෙයින් ඇතිවන අකුසල් වලින් මාව ආරක්ෂා කරත්වා !" යන්න එම දු ආවෙහි තේරුම වේ.

වර්තමානයේ මිනිසුන් හරාම්, හලාල් නොපිළිපැද ආහාර ගනිති. ඇඳුම් ආයිත්තම් පළඳිති. ගැහැණුන් පිරිමින් සේ, පිරිමින් ගැහැණුන් සේ හැසිරෙති. තවද අඩ නිරුවත්ව ලැජ්ජාශිලි නැතුව ඇවිද යති. ශිෂ්‍යයිනි, මේ සියළු දෑ ගැන අවධානය යොමු කොට හරාම්, හලාල් පිළිගෙන කටයුතු කර ජීවත්වන්නට අපි අදිටන් කර ගනිමු.

අභ්‍යාසය

ගැලපෙන වචන යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

නිරය, අව්රතය, අපිරිසිදු, මත්ද්‍රව්‍ය, රිදී, දෑත්, ස්වර්ගයට, බිස්මිල්ලාහ්, ක්‍රියාවන්

1. හලාල්වූ ආහාර හා ඇඳුම් පැළඳුම් අඳින විටදී අපගේ ................................ අනුමත කරනු ලබයි.
2. හරාම් අනුභව කළ කිසිදු සිරුරක් ........................................ නොපිවිසෙයි. ඊට හිමි ස්ථානය .. ................................ යයි රසූල් (සල්) පවසා ඇත.
3. .................................................. භාවිතය හරාම් ය.
4. ආහාර ගැනීමට පෙර ...................................................... හා මුව සෝදගන්න.
5. ආහාර ගැනීමට පෙර .................................................. යයි කීම සුන්නත් වේ.
6. ගැහැණු පිරිමි දෙපක්ෂයම ................................................ වැසිය යුතු ඇඳුම් ඇඳීම අනිවාර්ය වේ.
7. පිරිමින් ...................................................... වලින් සාදන ලද මුදුවක් පමණක් පැළඳිය හැක.
8. ........................................................ නිවස ඉස්ලාම් අප්‍රිය කරයි.

කෙටි පිළිතුරු සපයන්න.

(1) "දබිහ්" නොකර කෑමට හැකි දෑ නම් කරන්න.

(2) හරාම් දෑ අනුභව කිරීම කුමකට සැසඳිය හැකි ද?

(3) ස්වභාවයෙන් ම හරාම් වූ දෑ කුමක් ද?

(4) පිරිමින්ට හරාම් කරන ලද ඇඳුම් කුමක් ද?

(5) අව්රත් යනු කුමක් ද? ස්ත්‍රී පුරුෂ වෙන් වෙන්ව සඳහන් කරන්න.

## 4.4 දෙමව්පියන්ට ගරු කරමු

ළමයින් තම දෙමව්පියන්ට ඉටුකළ යුතු යුතුකම් හා ඔවුන් සමඟ ගොස් කෙසේ හැසිරිය යුත්තේ ද යන්නත් ඉස්ලාම් පැහැදිලිව විස්තර කර ඇත.

අප මැවූ පරමාධිපති අල්ලාහ් හැරුණුවිට ගුණ ගරුකවීමටත්, කීකරුවීමටත් සුදුස්සෝ දෙමව්පියන් බවත්, ඔවුන්ට ගුණගරුක හා උවටැන් නොකරන විට දඬුවම් ලැබීමට සිදුවෙතැයි අල්ලාහ් මෙහිදී අනතුරු අඟවයි.

අල්ලාහ් ඔහුගේ කලාමයේ දෙමව්පියන් ගේ යුතුකම් ගැන විටින් විට සඳහන් කරන්නේය.

"තම දෙමව්පියන් සමඟ විනීතව හැසිරෙන්න. ඔවුන්ට හිරිහැර නොකරන්න. ඔවුන්ට යටහත්ව සවන් දෙන්න. ඔවුන් කළ උදව් උපකාර වෙනුවෙන් ස්තූතිවන්ත වන්න."

(අල්-කුර්ආනය)

දෙමව්පියන්ගේ හිත් රිදවීම අපගේ ජිවිතයේ පසු බැම්වලට හේතුවන්නේය. එයින් අපට පාඩු විඳීමට සිදු වේ.

වරෙක නබි (සල්) තුමා වෙත කෙනෙකු පැමිණ. "මම මව් රට හා උපන් ගෙය හැර දමා පිටත් වී අල්ලාහ්ගේ ශුද්ධ වූ මාර්ගයේ සටන් කරන්නට යමි. මේ සඳහා වන ප්‍රතිඵලය මම අල්ලාහ්ගෙන් පමණක් අපේක්ෂා කරමි." යනුවෙන් පැවසීය. එවිට, නබි (සල්) තුමාණන්, "ඔබට දෙමව්පියන් සිටින්නේද?" යයි විමසූ විට, "අල්ලාහ්ගේ මහිමයෙන් දෙදෙනාම සිටිති" යයි පිළිතුරු දුන්නේය. "එසේ නම් ඔවුන්ට උපස්ථාන කරන්න. එය මගින් අල්ලාහ් ඔබට හිජ්රත් හා ජිහාදයේ ආනිසංස අත්කර දෙයි" යනුවෙන් නබි (සල්) තුමාණන් ප්‍රකාශ කළහ.

"මවගේ පාමුල ස්වර්ගය පවතින්නේය" යනුවෙන්ද, "ස්වර්ගයත්, නිරයත් ඔබ ලබාගන්නේ දෙමව්පියන් මගිනි" තවද "දෙමව්පියන්ගේ සතුට අල්ලාහ්ගේ සතුට වේ". යන්නද රසූල් (සල්) තුමාණන් නොයෙකුත් අවස්ථාවල ප්‍රකාශ කර ඇත.

දෙමව්පියන්ට කීකරු වී උවටැන් කර, ඔවුන් කළ උදව් උපකාරවලට ස්තූතිවන්ත වී ඔවුන් සමඟ ඉතා ගරු සරුව හැසිරීමෙන්, ස්වර්ගය ලබාගත හැකි වේ. මෙයට පටහැනිව හැසිරීමෙන්, එනම්, ඔවුන්ට කරදර දී, බැණ වැද, ඔවුන් සමඟ කුපිතව හැසිරීමෙන් අල්ලාහ්ගේ කෝපයට පාත්‍ර වේ.

"ඔබේ දෙමව්පියන්ගෙන් කෙනෙකු හෝ දෙදෙනාම වැඩි මහලු වී ඔබගෙන් යැපී සිටින විට ඔවුන්ට නින්දවන පරිදි "ච්" යනුවෙන් හෝ කිම නොකරන්න" (17 : 23)

වචනයක් වත් ඔවුන්ට අපහාසවන පරිදි නොදෙඩවන්න. ඔවුන් එසේ කළද එය ඉවසා විඳගන්න. ඒ වෙනුවෙන් ඔවුනට දෙස් නොපවරන්න. සැමද ඔවුන්ව ආදරයෙන් හා ගරුසරු ඇතිව අමතන්න.

"අල්ලාහ්ගේ පිළිකුල පියාගේ පිළිකුලයෙහි පවතී. අල්ලාහ්ගේ සතුට පියාගේ සතුටෙහි පවතී". ඔවුන්ට උවටැන් කිරීමෙන් අපේ ආයුෂ දීර්ඝ වන්නේය. ආහාරයේ බරකත්ද ඇති වේ.

"රසුල් (සල්) තුමාවෙත එක්තරා මිනිසෙකු පැමිණ, "අල්ලාහ්ගේ රසුල්වරයාණෙනි, ඉතා සෙනෙහසින් ඇසුරු කිරීමට සියල්ලන්ටම වඩා යෝග්‍ය අය කවරෙහුද?" යයි ඇසුවේය. එවිට නබිතුමන් "ඔබේ මව" යයි පැවසූහ. ඊළඟට කවුරුන්දැයි විමසූවිට, "ඔබේ මව" යනුවෙන්ම පිළිතුරු ලැබිණි. නැවත වරක් කවුරුන්දැයි ඇසූ විට "ඔබේ මව" යන පිළිතුරම ලැබිණි. සිව්වන වරටද එම ප්‍රශ්නයම ඇසූ විට "ඔබේ පියා" යයි පිළිතුර ලැබුණි. (බුහාරි-මුස්ලිම්)

දෙමව්පියන්ට උවටැන් කිරීම හා ඔවුන් සතුටෙන් තැබීම ඉබාදතයකි. "කෙනෙකු තම මවගේ මුණ දෙස ආදරයෙන් බලා සිටීමද පිං ගෙන දෙන්නෙකි."

වයස්ගත වූ විට ඔවුන්ගේ තෘප්තිය ලබා නොගන්නා අභාග්‍යවන්තයෙකි.

"යම් කෙනෙකු තම දෙමව්පියන්ගෙන් දෙදෙනාම හෝ කෙනෙකු වයස්ගතව සිටින තත්ත්වයෙන් ඔවුන්ට උවටැන් කර ස්වර්ගය ලබා නොගන්නා විනාශයට පත් වෙත්වා" යයි නබි (සල්) තුමාණන් වරෙක ශාප කර ඇත.

ළමයින් වන අපගේ යුතුකම, දෙමව්පියන්ගේ සිත් නොරිදවා කටයුතු කර ඔවුන්ගේ ආශිර්වාදය ලබා ගැනීම නොවේද! වර්තමානයේ සමහර දූ දරුවන් දෙමව්පියන්ට හිරිහැර කර ඔවුන්ව තලා පෙලා වස්තූන් පැහැරගෙන නිවසින් එළවා දමති. මෙවන් අය අල්ලාහ්ගේ කෝපයට පාත්‍ර වන්නෝය.

වරෙක රසුල් (සල්) තුමාණන්, "ඔහු විනාශයට පත්වේ" යයි තුන් වරක් ප්‍රකාශ කළේය. එවිට සහාබාවරුන් ඔහු කවුරුන් දැයි ප්‍රශ්න කළ විට, "දෙමව්පියන් දෙදෙනාම හෝ කෙනෙකු වයස්ගතව සිටින විට ඔවුන්ට උවටැන් නොකර ස්වර්ගය නොලබා ගන්නාය" යනුවෙන් පිළිතුරු ලබා දුන්හ. (මුස්ලිම්)

"මිනිසෙකු තම පියාගේ මරණයෙන් පසු පියාගේ මිත්‍රයින්ට තම යුතුකම් ඉටුකිරීම ඔහු කරන ආනිසංස වලින් බලවත්ම ආනිසංසය වන්නේය".

දෙමව්පියන්ට පමණක් නොව, ඔවුන්ගේ ඥාති මිත්‍රාදීන්ටත් උවටැන් කිරීම වැදගත් වන්නේය.

"ඔහු හැර වෙන දෙවියෙකු නැමදීමෙන් වළකින්න දෙමව්පියන්ට කීකරු වී, යහපත් දෑ ඉටුකරන්න. මෙය ඔබ දෙවියාගේ අණය වන්නේය" (අල්කුර්ආනය)

<u>අභ්‍යාසය</u>

(1) දෙමව්පියන්ට ඉටුකළ යුතු යුතුකම් ලයිස්තු ගත කරන්න.

(2) දෙමව්පියන්ගේ යුතුකම් ගැන සඳහන් කරන හදිස් සහ අල් කුර්ආන් වාක්‍ය ලියන්න.

(3) පියෙකුගේ අභාවයෙන් පසු දරුවෙකු වැඩි ආනිශංස ලබා ගැනීමට කුමක් කළ යුතු ද?

(4) දෙමව්පියන්ව කෙසේ ඇමතිය යුතු ද?

# 4.5 හුකූකුල් ඉබාද්

අල්ලාහ් මිනිසා මිහිපිට ඔහුගේ නියෝජිතයෙකු වශයෙන් මවා ඇත්තෙහිය. තම ස්වාමියා වෙනුවෙන් යුතුකම් කිහිපයක් ඉටුකිරීමට නියෝජිතයා බැඳී සිටී. මෙසේ මිනිසා අල්ලාහ් වෙනුවෙන් ඉටුකළ යුතු වගකීම් "හුකූකුල්ලාහ්" නම් වේ.

අල්ලාහ්, තම එකම දෙවියා ලෙස පිළිගෙන නැමදි, ඔහුට අවනතවීම, ඔහුගේ අණ පිළිපැදීම, මුහම්මද් (සල්) තුමා අල්ලාහ්ගේ රසූල් වශයෙන් පිළිගෙන, අනුගමනය කිරීම "හුකූකුල්ලාවෙහි" අඩංගු වේ. මේ හැර අල්ලාහ්ගේ නියෝජිතයා ලෙස, මිනිසා තමා වෙනුවෙන් ඉටුකළ යුතු යුතුකම් හා සමාජයේ සෙස්සන් වෙනුවෙන් ඉටුකළ යුතු යුතුකම්, ජීවීන් වෙනුවෙන්, අල්ලාහ්ගේ වෙනත් මැවීම් වෙනුවෙන් ඉටුකළ යුතු යුතුකම් "හුකූකුල් ඉබාද්" යන නමින් හැඳින් වේ.

මිනිසා සමාජීය මැවීමකි උපතින්ම ඔහු සමාජය හා ගැටී ජීවත්වීම හුරු පුරුදු වී සිටී. අප සියළු දෙනා විචාර බුද්ධියෙන් හෙබි මිනිසුන් වන හෙයින් මිනිසා තවත් මිනිසෙකුට ඉටුකළ යුතු යුතුකම් බොහෝ තිබේ.

" මුස්ලිම්වරයෙකු තව මුස්ලිම්වරයෙකුගේ සහෝදරයෙකු වන්නේය" යනුවෙන් රසූල් (සල්) තුමාණන් පැවසූහ.

මිනිසාට තනිව ජීවත්විය නොහැක. ඔහු පවුලේ අය මෙන් වටපිටාව හා සමාජයත් සමඟ කටයුතු කළ යුතුයි, යන්න කුර්ආනය මෙසේ විග්‍රහ කරයි.

"විශ්වාසවන්තයිනි, යහපත් ක්‍රියාවන්හි හා දේව බැතියෙහි එකා අනෙකාට උපකාරීවන්න ! අකුසලයන්හි හා සමාජ විරෝධී ක්‍රියාවන්හි එකා අනෙකාට උදවු උපකාරී නොවන්න".

සමාජීය ජීවන රටාව ඉස්ලාම් අවධාරණය කරයි. සමාජයෙහි පැවැත්මට හා සාමය වෙනුවෙන් මග සකසා දෙයි. මිනිසෙකු තවත් මිනිසෙකුට උදව් උපකාර කිරීමෙන් බොහෝ පිං ලබා ගත හැකිය. ව්‍යසනවලදී විපතට පත් ජනයාට සෙත සැලසීම, උම්රා යුතුකම ඉටු කිරීමට වඩා වැදගත් වේ.

සිය දිවි නසා ගැනීම ඉස්ලාමයේ හරාම් කර ඇත. මිනිස් ඝාතනයත් එලෙසමය. තම ජීවිතය හා දේහය ආරක්‍ෂා කිරීම වැදගත් වේ. තමා මෙන්ම අනෙකාගේද ජීවිතයත්, දේහයත් ආරක්‍ෂා කිරීම යුතුකමකි. සමාජයේ යම් කෙනෙකු විපතට පත් වූ විට ඔහුට සහන සැලසීම, මුළු සමාජයේම යුතුකම වේ.

දිළින්දගේ කුසගිනි නිවීම, ව්‍යසනයට ගොදුරුවූවන්ට සෙත සැලසීම, ආහාරපාන, ඇඳුම් දන්දීම, රැකියාවකට මග පෙන්වීම, යහපත් දෑ කියාදීම, මහල්ලන්, රෝගීන්, අංගවිකල වූවන්, අනාථයන් යන අයට උදව් උපකාර කිරීම, ඉස්ලාමයේ බුද්ධිමතුන් බිහිකිරීම, ආලිම්වරුන්ට උපස්ථාන කිරීම, වෛද්‍යවරුන් බිහිකිරීම යන මේවා පුද්ගලික හා සාමූහික වගකීම් වන්නේය. මෙ මගින් සමාජයෙහි පුද්ගලයන් අතර සාමය හා සහජීවනය ඇති වන්නේය.

මොවුන් හැර සමාජයේ පීඩිතයන් වන අංගවිකලයන්, අනාථයන්, රෝගීන් වැනි සහෝදරයන්ටත් උදවු කළ යුතුය.

අප වට පිටාවෙහි ජීවත්වෙන අනිකුත් ජීවීන් අනවශ්‍ය ලෙස ඝාතනය කිරීම, හිරිහැර කිරීම, අංගවිකල කිරීම, ඔවුන්ගේ තරමට වඩා වැඩෙහි යෙදවීම යනාදීයෙන් වැළකී සිටිය යුතුයි.

සමාජයෙහි යහපත් ක්‍රියාවන්ට එකිනෙකට උදව්කර ගැනීම ද යහපත් වන්නේය. සමාජයෙහි සමාජිකයෙකු වශයෙන් යම් යම් අවස්ථාවල නොයෙකුත් භූමිකාවන් ලෙස පෙනී සිටීමට සිදු වේ. එක් එක් භූමිකාවන් මගින් අනුන්හට ඉටුවිය යුතු යුතුකම් මනාව දැන ගෙන ඒවා ඉටු කළ යුතුයි.

ගෘහ මූලිකයෙකු පවුලෙහි බර කරට ගෙන ක්‍රියා කළ යුතුයි. නොයෙකුත් රැකියාවන් වල නියැලී උපයා, පවුල වෙනුවෙන් වියහියදම් කළ යුතුයි. බිරිඳ තම නිවෙසෙහි කළමණාකරණය නිසියාකාරව කළ යුතුයි.

තම පවුලෙන් පිටත අසල්වැසියන්, ඥාතීන් සමඟ විනීතව හැසිරීම, හදිස්සියකදී උදව් උපකාර කිරීම, සතුටකදී දිරි ගැන්වීම, ශෝකයේ දී සැනසීම, ඔවුන්ගේ හිමිකම් උල්ලංඝනය නොකර කටයුතු කිරීම්, මේ සියලු දෑ, "හුකුකුල් ඉබාද්" ඝනයට අයත් වේ.

"සදකතුල් ජාරියා" යයි හුවා දක්වන මාර්ග ඉදිකිරීම්, ලිං හා වැසිකිලි තැනීම්, වෛද්‍ය මධ්‍යස්ථාන ඉදිකිරීම්, පාසල්, පල්ලි, පුස්තකාල, ගොඩනැගිලි ඉදිකිරීම්, පරිසර තුරුලතාවන් ගෙන් අලංකාර කිරීම්, පරිසර ආරක්‍ෂා කිරීම් යනාදි සියළු දේ "හුකුකුල් ඉබාද්" ඝනයට අයත් වේ.

අල්ලාහ් නමදිමු. ඔහුට කිසිවක් සමානයන් නොතබමු. දෙමාපියන්ටද, නෑයන්ටද, අනාථයන්ටද, දිළිඳුන්ටද, අසල්වැසි නෑයන්ටද, අසල්වැසි නොවන නෑයන්ටද, සහකාරයාටද, මඟියන්ටද තොපගේ දකුණු අත් හිමි කරගත් අයටද සංග්‍රහ කරවු, ඇත්තෙන්ම අල්ලාහ් අහංකාර අයවද පුහුමාන්නක්කාරයන්වද ප්‍රිය නොකරන්නේය.

"හුකුකුල් ඉබාද්" හි පෙන්වා දෙන සියලු කරුණු මුස්ලිම්වරුන් පමණක් අදාල කරගෙන නොවේ. එයට අන්‍ය ආගමිකයන්ට ඉටු කළ යුතු යුතුකම් ද ඇතුලත් වී ඇත.

අන්‍ය ආගමිකයන් සමඟ අප කුමනාකරයේ සම්බන්ධතා පවත්වා ගෙන යා යුතුද, පවත්වා ගෙන නොයා යුතුද යන්න පවා මෙහි සවිස්තරාත්මකව විස්තර කර ඇත. එය හොඳින් වටහා ගෙන ක්‍රියා කිරීම මුස්ලිම්වරු වන අපගේ පරම යුතුකමකි.

මිනිසා, කුමන සමුහයකට අයත් වුවද කුමන ආගමකට අයත් වුවද කුසගින්න ඇති වු විට ආහාර ගැනීම, පියාපසය ඇති වු විට ජලය පානය කිරීම, අසනීප වු විට බෙහෙත් ගැනීම, නිසි වයසේ දී විවාහ වීම, යනාදි මෙලොව ජිවත් වීමට අනශ්‍ය සියල්ල සපුරා ගත යුතුය. අප මුස්ලිම්වරු වශයෙන් ඒවා සිදුකරන ආකාරය වෙනසි වුවද මිනිස් ශරීරය, අවයවයන් ක්‍රියා කරන විලාශය, හැඟීම් එක සමානය.

එම නිසා ඔවුන් සමග ස්නෙහයෙන්, උදව් - උපකාර කර ගනිමින්, යහපත්ව හැසිරිය යුතු බවත් මනුෂ්‍යත්වයට ගරු කර යුතු බවත් අල්ලාහ් පෙන්වා දෙයි.

"විශ්වාසවන්තයිනි, ආගමික හේ දමන ඔබලා සමග විරුද්ධ වී යුද නොවැද, ඔබලාගේ නිවස වලින් ඔබලාව පිටමන් නොකළ අයට ඔබලාට කාරුණික වී යහපත ඉටුනොකරන කියා හේ ඔවුන් සමග සංසුන්ව ක්‍රියා නොකරන්න කියා අල්ලාහ් ඔබලාව වළක්වා නැත. නිශ්චිත වශයෙන්ම අල්ලාහ් නිති ගරුකයින්ට සෙනෙහස දක්වන්නේය"

(අල්-කුර්ආන්)

එම නිසා කුමන සමුහයකට අයත් වුවද උදව් කර ගැනීම, කරදරයක සිටින්නව එයින් විදවීමට උත්සහ කර ගැනීම, කරදරයක සිටින්නව එයින් මිදවීමට උත්සහ කිරීම මිනිසෙකු වශයෙන් ඉටු කළ යුතු යුතු කම් වේ. ඔවුන්, ඔවුන්ගේ ස්ථාන වල ආගමික වතාවන් පුද පුජාවන් සිදු කරන්නේ නම් ඒවා වළක්වා, රණ්ඩු කර ගැනීම භේද බින්න වීම යහපත් නොවේ. එහෙත් අප, අපගේ ආගම හා සංස්කෘතිය ආරක්‍ෂා කර ගත යුතුයි.

ඉස්ලාමයෙහි අයිතිවාසිකම යනු අල්ලාහ් මිනිසාට ලබා දුන් අමානතයකි. එය සුරැකිය යුතුයි.

අභ්‍යාසය

කෙටි පිළිතුරු සපයන්න.

(1) "හුකුකුල් ඉබාද්" යන පදයෙහි තේරුම ලියන්න.

(2) හුකුකුල් ඉබාද්, කෙසේ ආගමික කටයුතු හා සමාජීය කටයුතු වන්නේ ද?

(3) මිනිසුන් අතර ශ්‍රේෂ්ඨයා කවරෙහුද?

(4) හුකුකුල් ඉබාදත් සමහරක් ගොනු කර දක්වන්න.

(5) සමාජයෙහි දිළින්දන් ලෙස හැඳින්වෙන්නෝ කවරහුද?

(6) ජිවින්ට කළ යුතු, නොකළ යුතු දෑ වෙන් වෙන්ව සටහන් කරන්න.

(7) සදකතුල් ජාරියා යනුවෙන් කුමක් අදහස් වන්නේද?
සදකතුල් ජාරියා කිහිපයක් ලියා දක්වන්න.

ක්‍රියාකාරකම්

(1) හුකුකුල් ඉබාදත් පිළිපදින්න.
(2) සමාජයේ යහපත තකා සංගම් හා සමාජ පිහිටුවීමට උදව් උපකාර කරන්න.
(3) ශ්‍රමදාන කටයුතුවලට සහභාගී වන්න.

# 4.6 මධ්‍යස්ථභාවය

අල්කුර්ආනය, "ඔබ අන්‍යන්ට සාක්ෂිකයන් වශයෙන්ද ඔබ හට නබි සාක්ෂිකයෙකු වශයෙන්ද සිටින ලෙස අපි නුඹලාව මධ්‍යස්ථභාවයෙන් යුතු පිරිසක් ලෙස ඇති කළෙමු." යැයි සඳහන් කරයි.

"මිනිසුන් ඉදිරියේ හිස නොහරවනු, පොළොවෙහි ආඩම්බර වී නොහැසිරෙනු. මධ්‍යස්ථව පය තබනු. කටහඬ පහත් කරනු. ශබ්දයෙහි පිළිකුල් සහගත හඬ බූරුවාගේ හඬය." (අල්-කුර්ආන්)

"මිනිසුනි, මධ්‍යස්ථාභාවය පිළිපදිනු. මධ්‍යස්ථභාවය පිළිපදිනු. මධ්‍යස්ථභාවය පිළිපදිනු. යම් කෙනෙකු තමා තමාටම විනා කරගන්නා මිස අල්ලාහ් ඔහුට විනා නොකරයි. ඔබට හැකි අයුරින් යහපත් ක්‍රියාවන් කරන්න. ඔබව ඔබම දුෂ්කරතාවට පත්කර වන්නේද මිස අල්ලාහ් ඔබව දුෂ්කරතාවට පත් නොකරන්නේය." (අල්-හදීස්)

"යහපත් ගතිගුණ, සිතුවිලි හා මධ්‍යස්ථභාවය නබිත්වයෙහි හැත්තෑවෙන් එක් කොටසක් වන්නේය." අපගේ වියහියදම්වලද මධ්‍යස්ථභාවය රැකීම ජිවනෝපායෙහි අඩක් වේ. මිනිසුන් සමඟ යහපත්ව හැසිරීම ඥානත්වයේ අඩකි. (යමෙකුගෙන්) යමක් ඉල්ලන්නේ නම්, එය යහපත්ව ඉල්ලීම දැනුමෙන් අඩකි"

"ඔබ බඩුබාහිරාදියත් හා වියහියදම් වලදී ප්‍රමාණයට වඩා ඉක්ම යෑම ගැන අවධානයෙන් සිටින්න. යමෙකු යහපත් ක්‍රියාවන්වලදී මධ්‍යස්ථභාවය නොපිළිපදින්නේද ඔහුට ආගම පිළිබඳ නිසි වැහීමක් නැත. මධ්‍යස්ථව කටයුතු කරන ලෙස මා ඔබට පවසමි. මධ්‍යස්ථව හැසිරුණු කිසිම සමාජයක් වැනසී ගියේ නැත. වස්තුවෙහි මධ්‍යස්ථභාවය කොතරම් අලංකාරද වතාවන්හි මධ්‍යස්ථභාවය කොතරම් අලංකාරවත් ද?" යැයි රසූල් (සල්) තුමා පවසා ඇත.

මේ නිසා මුස්ලිම්වරයෙකු තම ජිවිතයේ අනිවාර්යයෙන්ම මධ්‍යස්ථභාවය පිළිපැදිය යුතුයි. මිනිසෙකු ලෙස ජිවත්වීමට එය ඉවහල් වේ. බහුජන සමාජයක වැසෙන අපි මධ්‍යස්ථභාවයෙන් ඉවසීමෙන් කටයුතු කරන්නට හුරු පුරුදු වෙමු.

අභ්‍යාසය (වාචික පරීක්ෂණය)

(1) (1) ඉස්ලාම් මධ්‍යස්ථභාවය ගැන කවර අදහසක් දරන්නෙහිද?

(2) මධ්‍යස්ථභාවය අවශ්‍යවන්නේ ඇයි?

(1) ක්‍රියාකාරකම :

මධ්‍යස්ථභාවය ගෙන හැරපාන කුර්ආන් වාක්‍ය, හදීස් කටපාඩම් කරන්න.